කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය
கொம்ப்ரோலர் ஜெனரல் அலுவலகம்
**Comptroller General's Office**

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி,பொருளாதார மற்றும் கொள்கைகள் அபிவிருத்தி அமைச்சு
**Ministry of Finance, Economic and Policy Development**

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01
செயலகம்,கொழும்பு 01
The Secretariat, Colombo 01

කොම්ප්ට්‍රොලර් ජනරාල්
கொம்ப்ரோலர் ஜெனரல் 0112151452
Comptroller General

පොදු
பொது 0112151425
General

ෆැක්ස්/தொலைநகல் / Fax : 0112151417
Web Site :www.treasury.gov.lk
E-Mail : cgo@mo.treasury.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | CGO/ASM/REV/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2020.06. 22 |

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2020

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>2020 ජුනි 30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව</u>

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුලත් 2016 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛ අංක 01/2015(v) මගින් සංශෝධිත 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2018 මාර්තු 22 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(xii) අනුව 2018 ජනවාරි 01 දින සිට, පහත අදායම් සංකේතකාංකයන් යටතේ, ප්‍රාග්ධන වත්කම් විකිණීමේ ආදායම් ගිණුම් තැබීම් නිලධාරියා ලෙස කොම්ප්ට්‍රොලර් ජනරාල් පත් කර ඇත.

| ආදායම් සංකේතාංක | විස්තරය |
|---|---|
| 20.06.02.01 | වාහන |
| 20.06.02.02 | අනිකුත් |

මු.රෙ. 128(2) (ඇ) විධිවිධාන අනුව, ඉහත සඳහන් ආදායම් සංකේතාංකයන් යටතේ එකතු කරන ආදායම් පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන තොරතුරු අනුව,කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

03. ඒ අනුව, ඉහත සඳහන් එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි අනුව පවත්වාගෙන යනු ලබන ආදායම් හා හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි සඳහන් පරිදි මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයන්ට අදාළව සකස් කරන ලද තොරතුරු 2020 ජූලි 14 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් කටයුතු කල යුතු වේ.

I. මේ සමඟ අමුණා ඇති CGO/REV/ARE/01 ආකෘති පත්‍රය අනුව, 2020 ජූනි 30 දිනට සකස් කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව (අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කර හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය).

II. මේ සමඟ අමුණා ඇති CGO/REV/ARE/02 ආකෘති පත්‍රය අනුව, 2020 වර්ෂයේ මුල් මාස හය තුල දී රැස් කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව සහ අදාළ කාලපරිච්ඡේදය තුල දී මු.රෙ. 113 පරිදි මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් අනුමැතිය අනුව අතහරිනු ලැබූ ආදායම් පිළිබඳ වාර්තාව.

04. තවද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(v)අනුව ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් නිසි පරිදි පවත්වා ගත යුතු වේ.

කේ.ඒ. රම්‍යා කාන්ති
කොම්ප්ට්‍රොලර් ජනරාල්

පිටපත්:

01. විගණකාධිපති
02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආකෘති පත්‍ර අංක (CGO/REV/ARE/01)

## 2020.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

(i) ව්‍යවස්ථාපිත අධිකාරිය : (අදාල අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)
(ii) ආදායම් අයිතමය : ........................................................................................
(iii) ආදායම් සංකේතාංකය: ........................................................................................

| විස්තර | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු * | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග * | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය * |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017.12.31 දක්වා සමුච්චිත හිඟ මුදල (රු.) | 2018 වසරට අදාල හිඟ මුදල (රු.) | 2019 වසරට අදාල හිඟ මුදල (රු.) | 2020.06.30 දිනට අදාල හිඟ මුදල (රු.) | 2020.06.30 දක්වා මුළු හිඟ මුදල (රු.) (2+3+4+5) | | | |
| (01) | (02) | (03) | (04) | (05) | (06) | (07) | (08) | (09) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2019.12.31 දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2020 වර්ෂයේ මුල් මාස 06 දක්වා වන අයවීම් ඇතොත් ඒවා අඩුකල පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතු වේ. එසේ නැතහොත් අදාළ වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

* 07,08 හා 09 තීරු සඳහා වලංගු හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය.

සකස් කළේ : .................................................

පරීක්ෂා කළේ : .................................................
ප්‍ර.මූ.නි./අධ්‍යක්ෂ(මුදල්)/ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.................................................................

ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)

දිනය : .................................................................

ආකෘති පත්‍ර අංක (CGO/REV/ARE/02)

**<u>2020.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම පිළිබඳ ප්‍රකාශය</u>**

අදාල අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය:

ආදායම් සංකේතාංකය:

| විස්තරය | 2020 වර්ෂය තුළ හිඟ ආදායම් එකතු කිරීම | | | | 2020 මුල් මාසහය තුළ හිඟ ආදායම් අත්හැර දැමීම | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2017.12.31 දක්වා | | 2018 | | 2019 | | |
| | 2017.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | 2018 වසරට අදාළ හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | 2019 වසරට අදාළ හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම (2+3+4) | අදාළ හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් මහා භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | වසරට අදාළ හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් මහා භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | වසරට අදාළ හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් මහා භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | හිඟ මුදලට අදාළවඅත්හැර දැමීම් වල මුළු එකතුව (06+08+10) |
| (01) | (රු)<br>(02) | (රු)<br>(03) | (රු)<br>(04) | (රු)<br>(05) | (රු)<br>(06) | (07) | (රු)<br>(08) | (09) | (රු)<br>(10) | (11) | (රු)<br>(12) |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

එක් එක් ආදායම් සංකේතාංක යටතේ වන යම්කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. එබැවින් මෙ යටතේ සඳහන් කළ යුත්තේ එසේ මහා භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ) අධිකාරී බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාළ එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් දමේ සමඟ ඇමිණිය යුතු වේ.

සකස් කළේ : ................................................

පරීක්ෂා කළේ : ................................................

**ප්‍ර.මු.නි./අධ්‍යක්ෂ(මුදල්)/ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී**

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

................................................................

**ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ දිස්ත්‍රික් ලේකම්**

(නිල මුද්‍රාව)

දිනය : ................................................................